# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන
## (සංශෝධන)

**1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා විසින්
2026 අගෝස්තු මස 07 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 ජුනි මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[75 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 29.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මෙම වගන්තිය මඟින් (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත පොදුවේ සංශෝධනය කරනු ලබන අතර, සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ ''අධ්‍යක්ෂවරයා'' යන යෙදුම සඳහන් වන සෑම ස්ථානයකට ම ඒ වෙනුවට ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යන යෙදුම ආදේශ කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 2 වන වගන්තිය මඟින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***4 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධනය 2 වන වගන්තිය මඟින් කරනු ලබන සංශෝධනයට ආනුෂංගික වේ.

***5 වන වගන්තිය :*** මෙම වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එම සංශෝධිත වගන්තියේ නීතිය බලපෑම වනුයේ ''අපනයන කෘෂිකර්ම භෝගය'' යන යෙදුමේ අර්ථ නිරූපණය සඳහා අලුත් අර්ථ නිරූපණයක් ආදේශ කිරීම වේ.

එල්.ඩී.-ඕ. 57/2025

## 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක       දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1992 අංක 46 දරන පනතට කරනු ලබන පොදු සංශෝධනය

**2.** (මෙහි මින්මතු ‘‘ප්‍රධාන ප්‍රඥප්තිය’’ යනුවෙන් සඳහන් කරනු ලබන) 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනතේ ‘‘අධ්‍යක්ෂවරයා’’ යන වචනය යෙදෙන සෑම ස්ථානයක ම ඒ වචනය වෙනුවට ‘‘අධ්‍යක්ෂ ජනරාල්වරයා’’ යන වචන ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ ‘‘නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන්’’ යන වචන වෙනුවට ‘‘අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයන්, අධ්‍යක්ෂවරයන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයන් සහ සහකාර අධ්‍යක්ෂවරයන්’’ යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ ‘‘නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකුගේ හෝ සහකාර අධ්‍යක්ෂවරයකුගේ’’ යන වචන වෙනුවට ‘‘අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකුගේ, අධ්‍යක්ෂවරයකුගේ, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකුගේ හෝ සහකාර අධ්‍යක්ෂවරයකුගේ’’ යන වචන ආදේශ කිරීමෙන්.

PL 15894 - 342(2026/08)

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සහ සහකාර අධ්‍යක්ෂවරයකු ම" යන වචන වෙනුවට "අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හෝ සහකාර අධ්‍යක්ෂවරයකු ම" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සහ සහකාර අධ්‍යක්ෂවරයකු ම" යන වචන වෙනුවට, "අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයකු, අධ්‍යක්ෂවරයකු, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු හෝ සහකාර අධ්‍යක්ෂවරයකු ම" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ "අපනයන කෘෂිකර්ම භෝගය" යන යෙදුමේ අර්ථ නිරූපණය වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

""අපනයන කෘෂිකර්ම භෝගය" යන්නෙන්, ආහාර භෝග භාණ්ඩයට අයත් වන වී, එළවළු, පලතුරු, අල භෝග සහ අතිරේක ආහාර භෝග හැර දේශීය පරිභෝජනයට අමතරව අපනයනය කිරීමේ හැකියාවක් ඇති භෝගයක් වශයෙන් හඳුනාගත් සහ මේ පනතේ 2 වන වගන්තිය යටතේ "නිවේදිත කෘෂිකාර්මික භෝගයක්" ලෙස විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද යම් භෝගයක් අදහස් වන අතර වැවිලි භෝගයක් ලෙස හඳුනාගත් යම් භෝගයක් මෙයට ඇතුළත් නොවිය යුතු ය;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**6.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.